**ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ එහි පරිපාලිතය - 2013**

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ එහි පරිපාලිතයෙහි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1961 අංක 28 දරන ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථා පනතේ 31 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයෙහි දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ විගණන මතය**

**(අ) තත්ත්වාගණනය කළ විගණන මතය - ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව**

මෙම වාර්තාවේ 2.2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**(ආ) තත්ත්වාගණනය කළ විගණන මතය - සමූහය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ හා එහි පරිපාලිතයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 සමූහයේ මූල්‍ය ප්‍රකාශන**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවට 2/3 කොටස් අයත් පරිපාලිතයක් වන ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගමේ (CPSTL) විගණකවරුන් පහත දැක්වෙන කරුණු පදනම් කර ගෙන 2013 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබුණි.

(i) සංස්ථාවට සහ ලංකා ඉන්දියානු තෙල් සමාගමට (LIOC) ආපසු ගෙවිය යුතු පිළිවෙලින් රු.1,065,397,574ක් සහ රු.120,238,623ක් වටිනා අතිරික්ත පර්යන්ත ගාස්තු 2008 සිට හිඟව තිබූ නමුත්, මෙම මුදල් පියවීම සඳහා කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ii) සංස්ථාවෙන් සහ ලංකා ඉන්දියානු තෙල් සමාගමෙන් ලැබුණු සම්බන්ධිත පාර්ශවයන්ගේ තහවුරු කිරීම් ලෙජරයේ දැක්වෙන වටිනාකම් සමග එකඟ නොවිණි. තවද, සංස්ථාවෙන් සහ ලංකා ඉන්දියානු තෙල් සමාගමෙන් පිළිවෙලින් ලැබිය යුතු රු. මිලියන 221.34ක් සහ රු. මිලියන 3.35ක් මතභේදයට තුඩු දී තිබුණි.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට වසරකට වඩා වැඩි වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු මුදල්වල ඇතුලත්ව තිබූ වටිනාකම රු.461,046,341ක්වූ පරිපාලිතයෙන් ලැබිය යුතු මුදල් ඒකාබද්ධ ගිණුම් පිළියෙල කිරීමේදී ඉවත් කර නොතිබූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් සමූහයේ මූල්‍ය ප්‍රකාශනවල වසරකට වඩා වැඩි වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු මුදල් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

### 2.2.2 සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන

#### 2.2.2.1 සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම

සංස්ථාව 2013 වර්ෂයේදී රු. මිලියන 7,984ක අලාභයක් දරා තිබීම, සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු. මිලියන 236,529ක සෘණාත්මක ශුද්ධ වත්කම් තත්ත්වයක් සංස්ථාවේ ඇතිවී තිබීම මෙන්ම ශුද්ධ අලාභය වැඩි වීමට 2012 වර්ෂයේ හෙජින් ගනුදෙනුව හේතුවෙන් ඇතිව තිබූ සෘණාත්මක බලපෑම සම්බන්ධව මම අවධානය යොමු කරමි. ඉකුත් වර්ෂයේ ශුද්ධ අලාභය වන රු. මිලියන 97,308ක් සමඟ සලකා බැලීමේදී සමාලෝචිත වර්ෂයේ අලාභය රු.මිලියන 7,984ක් දක්වා අඩු වී තිබූ නමුත් 2008 සිට අධික අලාභ ලැබීම හේතුවෙන් තව දුරටත් සංස්ථාවේ ශුද්ධ වත්කම් තත්ත්වය ඛාදනය වී තිබුණි. එබැවින් රජයේ මූල්‍ය සහාය නොමැතිව සංස්ථාව ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙසට අඛණ්ඩව පවත්වා ගැනීමට ඇති හැකියාව සැක සහිතය.

#### 2.2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රීලංගිප්‍ර) අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 ජනවාරි 01 දිනට පෙර අනුගමනය කළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රීලංගිප්‍ර) අනුව CPSTL (පරිපාලිතය) අත්පත් කර ගැනීමේ ලාභය සමූහයේ ලාභය හෝ අලාභය ගණනය කිරීමේදී වහාම හඳුනාගත යුතුව තිබුණි. කෙසේ වුවද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව ව්‍යාපාර පවරා ගැනීම මත වූ රු. මිලියන 2,485.6 ක ලාභය, සමූහයේ ලාභය හෝ පාඩුව ගණනය කිරීමේදී හඳුනාගෙන නොතිබුණු අතර එය 2010 වර්ෂයේ සිට සමූහයේ ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සංචිත වශයෙන් පෙන්නුම් කර තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 3.2 අනුව, සංස්ථාව විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය, **ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය** යොදා ගෙන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (SME) සඳහා පමණක් අවසර දෙනු ලැබූ මෘදුකාංගය භාවිතයෙන් ගණනය කර තිබුණි. ඒ අනුව, **ශ්‍රීලංගිප්‍ර 19 - සේවක ප්‍රතිලාභ** ප්‍රමිතිය පරිදි පාරිතෝෂික වෙන් කිරීමේ අවශ්‍යතාවය අනුගමනය කර නොතිබුණි.

(ඇ) ලබා දී තිබූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය අවසානයට නොවිසඳුණු නඩු 216 ක් පැවති අතර ඉන් රු.36,948,819ක, ඇ.ඩො 13,309,645ක, හා බ්‍රිතාන්‍ය පවුම් 90,812ක ඇස්තමේන්තු වටිනාකමින් යුත් නඩු 112ක් සංස්ථාවට එරෙහිව සහ රු.5,643,991,774ක, ඇ.ඩො 5,175,203ක හා බ්‍රිතාන්‍ය පවුම් 13,901ක ඇස්තමේන්තු වටිනාකමින් යුත් නඩු 18ක් සංස්ථාව විසින් බාහිර පාර්ශවයන්ට එරෙහිව පැවති බව නිරීක්ෂණය විය. තවද, ඉහත සඳහන් නඩු 216 අතුරින් නඩු 189ක් මෙම වාර්තාවේ දින වන විට නොවිසඳී පැවතුණි. කෙසේ වෙතත් සංස්ථාව විසින් බාහිර පාර්ශවයන්ට එරෙහිව ගොනු කර තිබූ නඩු තුනක් (3) ගැන පමණක් මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුලත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල හෙළිදරවු කර තිබුණි. එම නිසා **ශ්‍රීලංගිප්‍ර 37 - වෙන් කිරීම්, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්** ප්‍රමිතියට අනුකූල වන පරිදි නීතිමය වගකීම් වෙනුවෙන් ප්‍රමාණවත් වෙන් කිරීම් හෝ හෙළිදරවු කිරීම් සමාලෝචිත වර්ෂය අවසාන දිනයට මූල්‍ය ප්‍රකාශන තුල සිදු කර නොතිබුණි.

**2.2.2.3 ගිණුම්කරණ දුර්වලතා**

**-----------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කලින් ප්‍රත්‍යාගණනය කරන ලද ප්ලැටිනම් තොගයට නුසුදුසු ගැළපීම් සිදු කිරීම සහ සංස්ථාව විසින් මූල්‍ය ප්‍රකාශනවල වෙනමම හෙළිදරවු කර නොතිබූ ප්ලැටිනම් තොග අගය කිරීමේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය වෙනස් කිරීම හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට පිරිපහදුවේ ප්ලැටිෆෝමා ඒකකයේ අවශ්‍ය උපාංගයක් වන නව උත්ප්‍රේරක සකස් කිරීමට භාවිතා කරනු ලබන ප්ලැටිනම් (විශේෂිත ලෝහ) තොගවල රු.21,463,682ක ඍණ (බැර) ශේෂයක් පෙන්නුම් කෙරිණි. ඒ අනුව, තොගයේ වර්ෂ අවසාන ශේෂය මූල්‍ය ප්‍රකාශන තුල පැහැදිලිව පෙන්නුම් කර නොතිබූ අතර ප්‍රමාණවත් තොරතුරු නොමැති වීම හේතුවෙන් සත්‍ය බලපෑම විගණනයේදී නිශ්චය කිරීමට නොහැකි විය.

(ආ) සංස්ථාව විසින් ලංකා ඉන්දියානු තෙල් සමාගමට අයත් රු.7,346,782ක් වටිනාකමැති තෙල් තොගයක් භාවිතා කර තිබූ අතර එය සමාලෝචිත වර්ෂය අවසානයට අනෙකුත් ලැබිය යුතු මුදල් වලින් අඩු කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල අනෙකුත් ලැබිය යුතු මුදල් මෙන්ම තෙල් තොග ශේෂය ද ඊට සමාන වටිනාකමකින් අඩුවෙන් පෙන්නුම් කර තිබුණි.

(ඇ) සංස්ථාවේ හෙජින් ගනුදෙනුවලට අදාලව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දරන ලද වියදම් වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවට ගෙවිය යුතු රු.383,114,031ක් සහ සංස්ථාවේ සේවකයින්ට ගෙවිය යුතු වැටුප් රු.3,565,829ක් නුසුදුසු ලෙස සම්බන්ධිත පාර්ශවයන්ට ගෙවිය යුතු වටිනාකම තුල ඇතුලත් කර තිබුණි. තවද, හෙජින් ගනුදෙනු වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවට ප්‍රතිපූරණය කරන ලද එකතුව රු. මිලියන 50ක්, ශ්‍රී ලංකා මහ බැංකුවට ගෙවිය යුතු ගිණුමට ගිණුම් ගත නොකොට වැරදි සහගත ලෙස නීති වියදම් වශයෙන් ගිණුම්ගත කොට තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල ශ්‍රී ලංකා මහ බැංකුවට ගෙවිය යුතු ශේෂය හා නීති වියදම් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) පරිපාලිතයෙන් ලැබිය යුතු ලාභාංශ වටිනාකම රු. මිලියන 875ක් සංස්ථාවේ ගිණුම්වලට ඇතුලත් කර නොතිබුණු අතර ඒ හේතුවෙන් ඒකාබද්ධ ගිණුම් පිළියෙල කිරීමේදීද එය සැලකිල්ලට ගෙන නොතිබුණි.

(ඉ) සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු මුදල් ලෙස දක්වා ඇති හා ලංකා විදුලි බල මණ්ඩලයේ (CEB) මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු මුදල් වශයෙන් දක්වා ඇති හිඟ හිටි ශේෂයන් අතර රු. මිලියන 796ක වෙනසක් නිරීක්ෂණය විය. කෙසේ වෙතත් ලංකා විදුලි බල මණ්ඩලය ඉහත වටිනාකම තුල ඇතුලත් ප්‍රමාද වූ ගෙවීම් සඳහා ගණනය කරන ලද රු. මිලියන 766ක් වූ පොළිය ගෙවීම ප්‍රතික්ෂේප කර තිබූ අතර සංස්ථාව එම මතභේදය නොසලකා එය ලැබිය යුතු ලෙස ගිණුම් ගත කර තිබුණි.

**2.2.2.4 නොසැසඳූ වෙනස්කම්**

**-----------------------**

පහත සඳහන් නොසැසඳූ වෙනස්කම් නිරීක්ෂණය විය.

(අ) සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල සහ ඊට අනුරූපව පරිපාලිතයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති සම්බන්ධිත පාර්ශවයන්ගේ පිළිවෙලින් 2012 හා 2013 දෙසැම්බර් 31 දිනවලට පැවති ශේෂයන්හි රු. මිලියන 2,196.19ක හා රු. මිලියන 3,371.95ක වෙනස්කම් නිරීක්ෂණය විය.

එසේම, සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල සහ පරිපාලිතයේ මූල්‍ය ප්‍රකාශනවල තෙල් ගබඩා කිරීමේ හා බෙදා හැරීමේ සේවාවලට අදාලව පිළිවෙලින් 2012 හා 2013 දෙසැම්බර් 31 දින වලට රු. මිලියන 2,297.82ක හා රු. මිලියන 652.28ක වෙනස්කම් නිරීක්ෂණය විය.

(ආ) ලංකා බැංකුවේ හා මහජන බැංකුවේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කෙරෙන ශේෂයන් ඊට අනුරූපව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කෙරෙන ශේෂයන් සමග එකඟ නොවිණි. ඒ අනුව, එම මූල්‍ය ප්‍රකාශනවල පිළිවෙලින් රු. මිලියන 1,202ක හා රු. මිලියන 34ක වෙනස්කම් නිරීක්ෂණය විය.

**2.2.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුළු වෙළඳ ණය වූ රු.53,189,676,188න් රු.15,415,734,805ක් සහ රු.37,773,941,383ක් පිළිවෙලින් රාජ්‍ය ආයතන වලින් සහ පුද්ගලික ආයතන වලින් සමන්විත වූ අතර එයින් රු.339,877,818ක් වර්ෂ දෙක ඉක්මවූ හිඟ ශේෂයන් වේ.

2013 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ හිඟ හිටි ශේෂ පිළිබඳ විස්තර ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දක්වා ඇත.

| **වර්ගය** | **දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුළු හිඟය** | |
|---|---|---|
| | **2013** | **2012** |
| | **රු.** | **රු.** |
| 1. බෙදුම්කරුවන් | 1,017,123,765 | 947,723,789 |
| 2. ගුවන්සේවා | 34,725,218,564 | 29,887,871,353 |
| 3. විදුලි ජනක පිරියත (ලංවිම) | 7,154,095,254 | 27,823,749,142 |
| 4. විදුලි ජනක පිරියත (පුද්ගලික) | 5,412,175,605 | 17,064,591,449 |
| 5. රජයේ පාරිභෝගිකයින් | 2,617,900,530 | 20,776,542,402 |
| 6. පුද්ගලික පාරිභෝගිකයින් | 1,709,489,885 | 574,893,541 |
| 7. කෘෂි රසායනික | 23,639,740 | 26,534,377 |
| 8. ලිහිසි තෙල් | 527,351,340 | 535,322,865 |
| 9. වෙනත් | 2,681,505 | 74 ,544 |
| **එකතුව** | **53,189,676,188** | **97,637,303,460** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුළු හිඟ හිටි ශේෂය වූ රු. 53,189,676,188න් වර්ෂ 3 ඉක්මවූ හිඟ හිටි ශේෂය රු.280,420,496ක් වූ අතර, ඉන් හිඟ හිටි ශේෂය රු.231,027,426ක් සහිත ගනුදෙනුකරුවන් කිහිපදෙනෙකුට අඛණ්ඩව ඛනිජ තෙල් නිෂ්පාදන සපයා තිබුණි.

(ආ) පසුගිය වර්ෂවල මාගේ විගණන වාර්තාව මගින් පෙන්වා දුන් පරිදි සංස්ථාව විසින් බැංකු ඇපකර නොමැතිව ගුවන්සේවා ගනුදෙනුකරුවන් දෙදෙනෙකුට ණය පහසුකම් සපයා දී තිබුණි. මේ සම්බන්ධයෙන් කළමණාකරණයේ කරුණු දැක්වීම වූයේ *“රජයට අයත් ගුවන් සමාගමක් නිසා පෙට්‍රොනාස් (ගුවන් සේවා ගනුදෙනුකරුවකු) සම්බන්ධයෙන් කිසිදු ණය අවදානමක් නොමැති අතර පැහැර හැරීමකින් තොරව හිඟ ශේෂයන් පියවනු ලැබේ”*

යනුවෙනි. එසේ වුවත්, එම සමාගම සම්බන්ධයෙන් රු.3,603,910ක පමණ සම්පූර්ණ අඩමාණ ණය ප්‍රතිපාදනයක් සංස්ථාව විසින් මෙම වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල සිදු කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ගුවන්සේවා ගනුදෙනුකරුවන් හතර දෙනෙකුට බැංකු ඇපකර සීමාව ඉක්මවා ණය පහසුකම් ලබා දී තිබූ අවස්ථා නිරීක්ෂණය විය. බැංකු ඇපකර සීමාව ඉක්මවා ණය පහසුකම් ලබා දී තිබූ ප්‍රමාණය සියයට 50 සිට සියයට 121ක පරාසයක් දක්වා පැවතුණි.

(ඈ) යුධ කාල සීමාව තුල විශේෂ ණය පහසුකම් පදනම මත දින 5 ණය බෙදුම්කරුවෙකු සඳහා විශේෂ ණය පහසුකම් සපයා තිබුණු අතර තවත් දින 5 ණය බෙදුම්කරුවෙකුට ඔහුගේ විශේෂ ඉල්ලීමක් පරිදි විධිමත් අනුමැතියකින් තොරව විශේෂ ණය පහසුකම් සපයා තිබුණි. තවද, ගිවිසුමක් මත විදුලිජනක පිරියත ගනුදෙනුකරුවකුට ණය පහසුකම දීර්ඝ කර තිබුණි. කෙසේ වෙතත් පාරිසරික වෙනස්කම් හා අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීම පිළිබඳ සලකා බැලීමකින් තොරව මෙම පහසුකම් අඛණ්ඩව හා දිගු කාලීනව පවත්වාගෙන යාම විගණනයේදී සැක සහිත විය. 2013 දෙසැම්බර් 31 දිනට මෙම ගනුදෙනුකරුවන්ගේ හිඟ හිටි ශේෂය රු. මිලියන 1,863.7 ක් විය.

(ඉ) 2006 අගෝස්තු 08 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය සහ සංස්ථාවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය මූල්‍ය කළමණාකරු (ආදායම්) ගේ 2008 මාර්තු 24 දිනැති ලිපිය අනුව, සියයට 24 ක වාර්ෂික පොළී අනුපාතයක් ගනුදෙනුකරුවන්ගේ හිඟ හිටි ශේෂය මත අය කර ගත යුතුවේ. කෙසේ වුවද, දත්ත සැකසීම සහ තොග මට්ටම් සුපරීක්ෂණය වෙනුවෙන් සංස්ථාව විසින් භාවිතා කර තිබූ පරිපාලිතය මඟින් හඳුන්වා දුන් හා ක්‍රියාත්මක කරන ලද ව්‍යවසාය සම්පත් සැලසුම් කිරීම (ERP) සඳහා වන පද්ධති යොදා ගැනීම සහ දත්ත ක්‍රියාවලි පද්ධතිය (SAP) මඟින් ණය කාලය ඉක්මවූ නොපියවූ ඉන්වොයිස් මත පොළී ගණනය කිරීමේ පහසුකම සපයා නොතිබුණි. එම නිසා සංස්ථාව නොපියවූ ඉන්වොයිස් මත පොළිය අතින් ගණනය කර SAP පද්ධතිය යාවත්කාලීන කර තිබුණි. ඒ අනුව, හිඟ හිටි ශේෂ මත අය කරනු ලබන පොළියෙහි නිවැරදිභාවය හා සම්පූර්ණභාවය පිළිබඳ සහතික වීමට හැකි වන පරිදි විධිමත් පද්ධතියක් නිර්මාණය කර ක්‍රියාත්මක කිරීමට සංස්ථාව විසින් කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඊ) ණය ගෙවීම පැහැර හරින ලද, භාරදීම මත චෙක්පත් පදනමින් වූ ගනුදෙනුකරුවන් (Cheque on Delivery - COD) සඳහා හිඟ හිටි ශේෂයන් පියවන තෙක් මුදල් පදනම මත (Hard Cash basis) අඛණ්ඩව ඛනිජ තෙල් නිෂ්පාදන සපයා තිබූ අතර එය ණය පාලනයේ පැවති දුර්වලතාවයක් ලෙස නිරූපනය විය. උදාහරණ ලෙස 2013 සහ 2012 වර්ෂවලදී චෙක්පත් අගරු වීම මත හිඟ හිට තිබූ වටිනාකම් පිළිවෙලින් රු.64,942,385ක් හා රු.58,399,795ක් විය. 2013 වර්ෂයේ වටිනාකම රු.1,413,402,939ක් වූ චෙක්පත් අගරු වූ අවස්ථා 1,489ක්, 2012 වර්ෂයේ වටිනාකම රු.1,388,713,962ක් වූ එවැනි අවස්ථා 1,579ක් සමඟ සැසඳීමේදී එය අධික වටිනාකමක් ලෙස දක්නට ලැබුණි. මේ සම්බන්ධයෙන් විධිමත් පාලනයක් නොමැති වීම හේතුවෙන් ගනුදෙනුකරුවන් ඔවුන්ගේ කාරක ප්‍රාග්ධන කළමනාකරණය කර ගැනීම සඳහා මෙය පුරුද්දක් වශයෙන් යොදාගෙන තිබූ බව නිරීක්ෂණය විය.

(උ) 2013 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 53,189.7ක් වූ මුළු ලැබිය යුතු වෙළඳ ණය වලින් එකතුව රු. මිලියන 44,556.5කට අදාල ණය ගැතියන් 856 දෙනෙකු ඔවුන්ගේ ශේෂයන් සහතික කර නොතිබුණි. තවද, සහතික කළ ශේෂයන් හා ලෙජරයේ ශේෂයන් අතර රු. මිලියන 821.4 ක වෙනසක් නිරීක්ෂණය විය. කෙසේ වෙතත් වෙනස්කම් වලට අදාලව සැසඳුම් ප්‍රකාශයක් හෝ කළමණාකරණයේ පැහැදිලි කිරීමක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**2.2.2.6 හෙජින් ගනුදෙනු**

ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ හෙජින් ගනුදෙනුවලට අනුව වාණිජ බැංකු කීපයක් සමඟ එළඹ තිබුණු හෙජින් කොන්ත්‍රාත් සම්බන්ධයෙන් බේරුම් කිරීමේ ක්‍රියාවලියේ පාර්ශවයක් වශයෙන් සංස්ථාව කැඳවා තිබුණි. පාර්ශව අතර එළඹ තිබූ බේරුම් කිරීමේ ඔප්පුව යටතේ එ.ජ.ඩො මිලියන 60ක් (රු. මිලියන 7,612) ස්ටැන්ඩඩ් චාටර්ඩ් බැංකුවට (SCB) 2013 ජූනි 03 දින ගෙවා තිබුණි. ලැබී ඇති තොරතුරු අනුව නීති හා අනෙකුත් වියදම්ද ඇතුළුව 2014 අගෝස්තු 31 දිනට සංස්ථාව රු. මිලියන 9,780ක අලාභයක් දරා ඇත.

ඊට අමතරව ශ්‍රී ලංකා රජයට එරෙහිව ඩොයිෂ් බැංකුව ආරම්භ කර ඇති බේරුම් කිරීමේ ක්‍රියාවලිය සඳහා පෙනී සිටි විදේශ නීතිඥයින්ගෙන් ලබා ගත් සේවා සඳහා 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහ බැංකුව රු. මිලියන 378.7 ගෙවා තිබුණි. කෙසේ වෙතත් මෙම තත්ත්වය සහ වටිනාකම සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

**2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) යහපාලනය සඳහා රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ පිළිබඳ 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.2 වගන්තිය. | සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා අවම වශයෙන් ඛනිජ තෙල් කර්මාන්ත ක්ෂේත්‍රයේ සිටින එක් සාමාජිකයෙකු හෝ ඇතුලත්ව නොතිබුණි. |
| (ආ) 1997 ඔක්තෝබර් 24 දිනැති අංක 124 දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශ චක්‍රලේඛය. | පුරප්පාඩු තනතුරක රාජකාරි ආවරණය කිරීමේ කාලය මාස තුනක කාලයකට සීමා විය යුතු වුවත් සේවකයන් 16 දෙනෙකු විසින් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා මාස 2 සිට වසර 2 ක කාලයක් පුරප්පාඩු තනතුරුවල රාජකාරි ආවරණය කර තිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ මෙහෙයුම් කටයුතුවලින් ප්‍රතිඵලය රු. මිලියන 7,733ක බදු පෙර ශුද්ධ පාඩුවක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ පාඩුව රු. මිලියන 89,569ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු. මිලියන 81,836 ක වර්ධනයක් දැක්වුණි. මෙම වර්ධනය සඳහා බලපෑ ප්‍රධාන හේතු පහත සාරාංශගත කෙරේ.

| විස්තරය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | | වෙනස වාසිදායක/ (අවාසිදායක) | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | 2013 | 2012 | | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| ආදායම | 490,381 | 512,910 | (22,529) | (4.4) |
| විකුණුම් පිරිවැය | (467,638) | (573,692) | 106,054 | 18.5 |
| **දළලාභය/(අලාභය)** | **22,743** | **(60,782)** | **83,525** | **137.4** |
| අනෙකුත් ආදායම් | 374 | 285 | 89 | 31.2 |
| විකිණීමේ හා බෙදා හැරීමේ වියදම් | (11,965) | (12,633) | 668 | 5.29 |
| පරිපාලන වියදම් | 3,600 | 5,801 | 2,201 | 37.9 |
| **මෙහෙයුම් ලාභය** | **7,552** | **(78,930)** | **86,482** | **109.6** |
| මූල්‍ය වියදම් | (18,540) | (18,360) | (180) | (1) |
| මූල්‍ය ආදායම් | 3,255 | 7,721 | (4,466) | (57.8) |
| **ආදායම් බදු පෙර පාඩුව** | **(7,733)** | **(89,569)** | **81,836** | **91.4** |
| හෙජින් වියදම් | (214) | (7,612) | 7,398 | 97.2 |
| **වර්ෂයේ අලාභය** | **(7,984)** | **(97,308)** | **89,324** | **91.8** |

සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ මෙහෙයුම්වලින් සියයට 4.86ක ආන්තිකයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ වූ සියයට 10.59ක ඍණ ආන්තිකය සමඟ සැසඳීමේදී සියයට 15.45ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. එසේම, සමාලෝචිත වර්ෂයේදී දළ ලාභය ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ දළ අලාභය වූ රු. මිලියන 60,782 හා සැසඳීමේදී රු. මිලියන 83,525කින් හෙවත් සියයට 137කින් වැඩි වී තිබුණි. පෙට්‍රල් (ඔක්ටේන් 92 හා 95), ලංකා ඔටෝ ඩීසල්, කාර්මික භූමි තෙල් වැනි සමහර ඛනිජ තෙල් නිෂ්පාදනවල දේශීය විකුණුම් මිල වැඩි වීම සහ ලංකා භූමි තෙල්, ලංකා දැවි තෙල් (3500) හා ගුවන් සේවා ටර්බයින් ඉන්ධන වැනි පාඩු ලබන නිෂ්පාදනවල දේශීය විකුණුම් ප්‍රමාණය අඩු වීම සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් දායක වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ පරිපාලිතයේ මෙහෙයුම් කටයුතුවලින් රු. මිලියන 1,596ක බදු පෙර ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ ලාභය රු. මිලියන 2,193ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු. මිලියන 597ක පිරිහීමක් දැක්වුණි.


### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

#### (අ) සංස්ථාවේ ප්‍රාග්ධන බාදනය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 6 සඳහා සංස්ථාවේ ශුද්ධ ලාභය/(පාඩුව) හා ශුද්ධ වත්කම් තත්ත්වය පහත සඳහන් වගුවෙහි හා රූප සටහනනෙහි දැක්වේ.

| වර්ෂය | ලාභය/(පාඩුව) | වර්ෂය අවසානයට ශුද්ධ වත්කම් තත්ත්වය |
|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන |
| 2007 | 3,984 | 13,568 |
| 2008 | (14,952) | (1,416) |
| 2009 | (11,353) | (13,038) |
| 2010 | (26,923) | (39,952) |
| 2011 | (94,503) | (131,324) |
| 2012 | (97,308) | (228,545) |
| 2013 | (7,984) | (236,529) |




එම අඛණ්ඩ මූල්‍ය පාඩු හා ප්‍රාග්ධන ඛාදනය සඳහා හේතු වූ ප්‍රධාන කරුණු ලෙස ඉතා අඩු ආන්තිකය, අඩු ප්‍රතිලාභ හා පිරිපහදුවේ නිතර සිදුවන වැඩ නැවැත්වීම් සමග අකාර්යක්ෂම මෙහෙයුම් හේතුවෙන් ඌනතාවයන් මඟහැර ගැනීම සඳහා පිරිපහදු කරන ලද ඛණිජ තෙල් නිෂ්පාදිත ආනයනය, නැප්තා සහ දැවි තෙල් - 1500 අපනයනය, ගිවිසුම්ගත ගනුදෙනුකරුවන්ගේ මිලට වඩා අඩු සහන මිලකට ශ්‍රී ලංකන් එයාර් ලයින් සමාගමට හා මිහින් ලංකා සමාගමට ඉන්ධන සැපයීම, හෙජින් ගනුදෙනු තුළින් ඇති වූ අධික අලාභ, ඉන්ධන බිල් සඳහා මූල්‍යයනය කිරීමට බැංකු අංශයෙන් ලබාගන්නා ණය සංස්ථාව විසින් වැඩි කිරීම, ඛනිජතෙල් නිෂ්පාදිත ප්‍රසම්පාදන ක්‍රියාවලියේ අකාර්යක්ෂමතාවයන්, ලංකා විදුලිබල මණ්ඩලයට සහනදායී රේටයකට දැවිතෙල් සැපයීම, විධිමත් තොග මට්ටම් පවත්වා ගැනීමේ වැඩසටහනක් හා ගබඩා පහසුකම් නොමැතිවීම හා ප්‍රමාද ගාස්තු ගෙවීම ආදිය අනාවරණය විය.

සංස්ථාවේ මූල්‍ය දුෂ්කරතා සඳහා මුහුණ දීමට ඛනිජ තෙල් නිෂ්පාදනවල දේශීය සිල්ලර මිල ගණන් 2011, 2012 සහ 2013 වර්ෂවලදී ඉහළට සංශෝධනය කර තිබුණි. එම අවස්ථාවේදී ලංකා විදුලි බල මණ්ඩලය විසින් බල උත්පාදනය සඳහා යොදා ගනු ලබන ඉහළ සල්ෆර් හා පහළ සල්ෆර් යන නිෂ්පාදන දෙකෙහි මිල 2013 අප්‍රේල් 01 සිට ක්‍රියාත්මක වන පරිදි ලීටරයකට රු.25 බැගින් වැඩි කොට පිළිවෙලින් රු.90 හා රු.100 දක්වා ළඟා වී තිබුණි.

ඉකුත් වර්ෂය හා සැසඳීමේදී 2013 වර්ෂයේ සංස්ථාව විසින් ඛනිජ තෙල් නිෂ්පාදනවල සිල්ලර මිලෙහි සිදු කළ ප්‍රධාන වෙනස්කම් පහත පරිදි වේ.

| ඛනිජ තෙල් නිෂ්පාදන | ලීටරයක මිල (බලපැවැත්වෙන දිනය) | | වර්ෂය තුල මිල වැඩිවීම (ලීටරයකට) | | | |
|---|---|---|---|---|---|---|
| | 2012 දෙසැ. 14 | 2013 පෙබ. 22 | 2012 | | 2013 | |
| | රු. | රු. | රු. | ප්‍රතිශතය | රු. | ප්‍රතිශතය |
| පෙට්‍රල් ඔක්ටේන් 95 | 167.00 | 170.00 | 12.00 | 7.7 | 3.00 | 1.8 |
| පෙට්‍රල් ඔක්ටේන් 90/92 | 159.00 | 162.00 | 22.00 | 16.1 | 3.00 | 1.9 |
| ලංකා ඔටෝ ඩීසල් | 115.00 | 121.00 | 31.00 | 36.9 | 6.00 | 5.2 |
| ලංකා සුපර් ඩීසල් | 142.00 | 145.00 | 35.70 | 33.6 | 3.00 | 2.1 |
| ලංකා කාර්මික භූමි තෙල් | 111.00 | 115.00 | 35.00 | 46.1 | 4.00 | 3.6 |

**(ආ) වැදගත් ගිණුම්කරණ අනුපාත**

ලැබී ඇති තොරතුරු අනුව සංස්ථාවේ සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා වැදගත් අනුපාත කිහිපයක් පහත දැක්වේ.

| අනුපාත | 2013 | 2012 |
|---|---|---|
| **ලාභදායිත්ව අනුපාත** | | |
| දළ ලාභ අනුපාතය (%) | 4.64 | (11.85) |
| මෙහෙයුම් ලාභ අනුපාතය (%) | 1.54 | (15.39) |
| ශුද්ධ ලාභ අනුපාතය (%) | (1.63) | (18.97) |
| **ද්‍රවශීලතා අනුපාත** | | |
| ජංගම වත්කම් අනුපාත (වාර ගණන) | 0.32:1 | 0.41:1 |
| ක්ෂණික වත්කම් අනුපාත (වාර ගණන) | 0.16:1 | 0.26:1 |
| කාරක ප්‍රාග්ධනය (රු. මිලියන) | (287,661) | (256,768) |
| **ආයෝජන අනුපාත** | | |
| වත්කම් මත ප්‍රතිලාභ (%) | (4.27) | (47.18) |
| යෙදවූ ප්‍රාග්ධනය සඳහා ප්‍රතිලාභ (%) | (3.38) | (42.58) |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ඉකුත් වර්ෂය හා සැසඳීමේදී දළ ලාභ අනුපාතය හා ශුද්ධ ලාභ අනුපාතය පිළිවෙලින් සියයට 139කින් හා සියයට 91කින් වර්ධනය වී තිබුණි. ඉහත සඳහන් කර ඇති පරිදි 2013 වර්ෂයේදී ඛනිජ තෙල් නිෂ්පාදනවල විකුණුම් මිල ඉහළ දැමීම හා ජාත්‍යන්තර මිල ප්‍රවනතාව අනුව බොර තෙල්වල ආනයන පිරිවැය අඩු වීම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් දායක වී ඇත.

(ii) ඉකුත් වර්ෂය හා සැසඳීමේදී ජංගම වත්කම් අනුපාතය හා ක්ෂණික වත්කම් අනුපාතය පහළ අගයකට වෙනස් වී තිබුණි. ඒ අනුව සංස්ථාවේ කාරක ප්‍රාග්ධන තත්ත්වය පසුගිය වර්ෂය සමග සලකා බැලීමේදී තව දුරටත් බාදනය වී තිබුණි. මුදල් සහ මුදල් හා සමාන දෑ වල අඩු වීම හා පොළී මත ණය හා ණය ගැනීම්වල වැඩි වීම මෙම අඩු වීම සඳහා ප්‍රධාන වශයෙන් දායක වී ඇත.

## 4 මෙහෙයුම් සමාලෝචනය

### 4. 1 කාර්යසාධනය

2013 වර්ෂය සඳහා වන ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව අනුව 2013 වර්ෂය සඳහා ඛනිජ තෙල් නිෂ්පාදනවල (බොර තෙල් සහ පිරිපහදු කරන ලද නිෂ්පාදන) මුළු ආනයන පිරිවැය රු. බිලියන 535ක් වූ අතර එය 2013 වර්ෂය සඳහා පවතින වෙළඳපල අගය මත ගණනය කළ දළ දේශීය නිෂ්පාදනය (ද.දේ.නි) වන රු. බිලියන 8,674න් සියයට 6.2ක් නියෝජනය කර තිබුණි. තවද එය 2013 වර්ෂය සඳහා වන මුළු ආනයන වන රු. බිලියන 2,323න් ආසන්න වශයෙන් සියයට 23ක් පමණ නියෝජනය කරනු ලැබේ. විගණනයට ඉදිරිපත් වී ඇති තොරතුරු අනුව ඉහත දක්වා ඇති ආනයන සඳහා සංස්ථාව රු. බිලියන 460කින් පමණ දායක වී තිබුණි.

ආනයනය කළ බොර තෙල්වල සාමාන්‍ය මිල අඩුවී තිබීම සහ ඛනිජ තෙල් නිෂ්පාදනවල දේශීය සිල්ලර මිල වැඩි කිරීම සිදුවී තිබූ නමුත් පහත දැක්වෙන නිෂ්පාදනයන්ගෙන් සංස්ථාව අඛණ්ඩව පාඩු ලබා තිබුණි. විස්තර පහත දැක්වේ.

| අංශය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු ලාභය/(පාඩුව) | | |
|---|---|---|---|
| | 2013<br>රු.මිලියන | 2012<br>රු.මිලියන | 2011<br>රු.මිලියන |
| **ප්‍රවාහන** | | | |
| ලංකා ඔටෝ ඩීසල් | (6,235) | (29,654) | (62,045) |
| **විදුලිබල උත්පාදන** | | | |
| නැප්තා | (1,081) | (1,048) | (798) |
| දැවි තෙල් 3500 | (1,184) | (8,718) | (9,206) |
| දැවි තෙල් 1500 | (1,231) | (23,223) | (18,313) |
| දැවි තෙල් 1500 (L/S) | (9) | (11,733) | (5,764) |
| **ගුවන් කටයුතු** | | | |
| AVTEUR-ජාත්‍යන්තර | (1,251) | 122 | 114 |
| **කර්මාන්ත** | | | |
| දැවි තෙල් -1500 | (350) | (2,003) | (4,248) |
| දැවි තෙල් -800 | (333) | (904) | (1,790) |
| කර්මාන්ත භූමිතෙල් | (126) | (364) | (832) |

| | | | |
|---|---|---|---|
| ලිහිසි තෙල් | (271) | 46 | 217 |
| **දේශීය** | | | |
| LPගෑස් (K.G.) | (436) | (377) | (224) |
| භූමිතෙල් | (2,449) | (3,525) | (6,886) |
| **ගොවීන්** | | | |
| කෘෂි රසායන | (70) | (2) | (5) |
| **අපනයන** | | | |
| නැප්තා | (976) | (43) | (675) |
| දැවි තෙල් -1500 | (2,690) | (70) | (329) |
| **ඉන්ධන පිරවීම** | | | |
| ඩීසල් | (67) | - | - |
| දැවි තෙල් 1500 | (729) | - | - |

2013 වර්ෂයේදී සංස්ථාවේ පාඩු ලැබූ නිෂ්පාදන ඉකුත් වර්ෂ දෙකක් සමග සසඳා ඉහත වගුවේ දැක්වේ. ඒ අනුව ගුවන් කටයුතු අංශයේ AVTEUR-ජාත්‍යන්තර, කර්මාන්ත අංශයේ ලිහිසි තෙල්, ඉන්ධන පිරවීම් අංශයේ ඩීසල් හා දැවි තෙල් 1500 හැර අනෙකුත් සියළු නිෂ්පාදන අඛණ්ඩව පාඩු ලබා තිබූ අතර ඉකුත් වර්ෂ හා සැසඳීමේදී 2013 වර්ෂයේදී අපනයන අංශයේ පාඩු අධික ලෙස වැඩි වී තිබුණි.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතිය (ERP)**

සංස්ථාවේ ප්‍රධාන කර්මාන්ත තරඟකරු වන ලංකා ඉන්දියානු තෙල් සමාගමේ මව් සමාගමේ සහාය ඇතිව ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම (CPSTL) විසින් වැඩිදියුණු කරන ලද ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතියට (ERP) සංස්ථා දත්ත පදනම සම්බන්ධ කිරීමෙන් ඇතිවන අවදානම පිළිබඳ විධිමත් ඇගයීමක් සංස්ථාව විසින් සිදුකර නොතිබුණි. සංස්ථාවට මෙම කාර්යය සඳහා සැලකිය යුතු ප්‍රමාණයක එහි සම්පත් (ප්‍රාග්ධන හා මානව සම්පත්) යෙදවීමට සිදුව ඇති බැවින් ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධති ක්ෂේත්‍රය පිළිබඳ ප්‍රවීණයන්ගේ සහාය ඇතිව මෙම පද්ධති ඒකාබද්ධ කිරීම මගින් පැන නගින බලපෑම් පිළිබඳ විධිමත් හා ගැඹුරු විශ්ලේෂණයක් සිදු කළ යුතුව තිබුණි. තවද, මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පෙර අදාළ පාර්ෂවයන්ගේ වගකීම් සම්බන්ධයෙන් සංස්ථාව, ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම සහ ලංකා ඉන්දියන් තෙල් සමාගම අතර ගිවිසුමක් හෝ අවබෝධතා ගිවිසුමක් නොතිබූ බව නිරීක්ෂණය විය. ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම විසින් හඳුන්වා දෙන ලද ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතියට අනුකූලවන පරිදි සංස්ථාව විසින් එහි උපකරණ ආදිය වැඩිදියුණු කිරීම සඳහා යොදවන ලද ප්‍රාග්ධනය හා මානව සම්පත් වෙනුවෙන් වැය කරන මුදල් පිළිබඳ සැලකිල්ලට ගනිමින් පූර්ව ආරක්ෂිත ක්‍රියාමාර්ගයක් ලෙස ගිවිසුමක්/අවබෝධතාවක් තිබීමද ඉතා වැදගත් වේ.

**(ආ) ශ්‍රී ලංකන් එයාර් ලයින් සමාගමට හා මිහින් ලංකා (පුද්ගලික) සමාගමට සහනාධාර මිලට ඉන්ධන සැපයීම**

ශ්‍රී ලංකන් එයාර් ලයින් සමාගම සහ මිහින් ලංකා පුද්ගලික සමාගම කොන්ත්‍රාත් පාරිභෝගිකයන් වුවද, සංස්ථාව විසින් අතිවිශේෂ සහනදායී මිල ගණන්වලට ඉහත සමාගම් සඳහා ගුවන් සේවා ටර්බයින් ඉන්ධන අලෙවියෙන් 2011, 2012 හා 2013 වර්ෂ සඳහා පිළිවෙලින් රු. මිලියන 669.77ක, රු. මිලියන 456.6ක සහ රු. මිලියන 2,009.68ක පාඩු දරා ඇත. විස්තර පහත පරිදි වේ.

| සමාගමේ නම | වර්ෂය තුලදී සංස්ථාව දරා ඇති පාඩුව | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2013 | | 2012 | | 2011 | |
| | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන |
| ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් සමාගම | 14.10 | 1,866.39 | 3.29 | 423.97 | 5.47 | 627.16 |
| මිහින් ලංකා (පුද්ගලික) සමාගම | 1.08 | 143.29 | 0.25 | 32.58 | 0.38 | 42.61 |
| **එකතුව** | **15.18** | **2,009.68** | **3.54** | **456.55** | **5.85** | **669.77** |

සහනදායී මිල යටතේ මෙම සමාගම් දෙකට ඉන්ධන සපයා තිබියදීත්, ඔවුන්ගේ දුර්වල මූල්‍ය කාර්ය සාධනය නිසා හිඟ හිටි ඉන්ධන බිල් පියවීම ඉතා දුර්වල තත්ත්වයක පැවතුණි. එනම් 2013 වර්ෂය සඳහා වන ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව අනුව 2013 වර්ෂයේදී ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් සමාගම රු. බිලියන 28.6ක මෙහෙයුම් අලාභයක් වාර්තා කර තිබූ අතර මිහින් ලංකා (පුද්ගලික) සමාගම රු. බිලියන 1.5ක මෙහෙයුම් අලාභයක් වාර්තා කර තිබුණි. 2010 වර්ෂයේ සිට හිඟ හිටි ශේෂයන්ගේ වර්ධනයේ උපනතිය පහත දැක්වේ.

| සමාගමේ නම | දෙසැම්බර් 31 දිනට හිඟ හිටි ශේෂය | | | |
|---|---|---|---|---|
| | 2013 | 2012 | 2011 | 2010 |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් සමාගම | 29,519.68 | 25,890.12 | 12,351.43 | 541.54 |
| මිහින් ලංකා (පුද්ගලික) සමාගම | 4,313.68 | 3,416.10 | 1,227.02 | 361.24 |

2013 දෙසැම්බර් 31 දිනට මුළු ලැබිය යුතු වෙළඳ ණය වටිනාකම වන රු. මිලියන 53,190න් සියයට 64කට වඩා වැඩි ප්‍රමාණයක් ඉහත දැක්වූ සමාගම් දෙකෙන් ලැබිය යුතු වෙළඳ ණය නියෝජනය වී තිබුණි. කෙසේ වෙතත් සංස්ථාව මෙම සමාගම් දෙකේ දුර්වල මූල්‍ය කාර්ය සාධනය නොසලකා 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් සමාගමට රු. බිලියන 28 සිට රු. බිලියන 35 දක්වා සහ මිහින් ලංකා (පුද්ගලික) සමාගමට රු. බිලියන 3.6 සිට රු. බිලියන 5 දක්වා වශයෙන් ණය සීමාව වැඩි කර තිබුණි.

**(ඇ) බැංකු අංශයෙන් ණය ලබා ගැනීම් ඉහළ දැමීම**

සංස්ථාව විසින් ඛණිජ තෙල් බිල්පත් පියවීම සඳහා බැංකු වලින් ණය ලබා ගැනීම වැඩි කර තිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස සංස්ථාවේ අලාභය හා සෘණ ශුද්ධ වත්කම් තත්ත්වය වැඩි වී තිබුණි. තවද, සංස්ථාව අඛණ්ඩව පසුගිය අනුයාත වර්ෂ හතර තුල අධික මූල්‍ය පිරිවැයක් දරා තිබූ බව නිරීක්ෂණය වූ අතර එය පහත විස්තර වන පරිදි වැඩි වන උපනතියක් පෙන්නුම් කෙරේ.

| වර්ෂය | දෙසැම්බර් 31 දිනට බැංකු අංශයෙන් ණය ලබා ගැනීම් | සාමාන්‍ය මෙහෙයුම් කටයුතු වලින් වූ වාර්ෂික පාඩුව | මූල්‍ය පිරිවැය | මූල්‍ය පිරිවැය, සාමාන්‍ය මෙහෙයුම් කටයුතු මත වාර්ෂික පාඩුවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| 2010 | 168,020 | 26,923 | 6,859 | 26 |
| 2011 | 310,060 | 94,503 | 9,001 | 10 |
| 2012 | 399,520 | 89,569 | 18,360 | 21 |
| 2013 | 406,850 | 7,733 | 18,540 | 240 |

පහත පරිදි සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට විදේශ ණය ගැනීම් සඳහා සංස්ථාව වෙනුවෙන් මහා භාණ්ඩාගාරය බැංකු සඳහා ලබාදී තිබුණු ඇප සීමාවන් සංස්ථාව විසින් ඉක්මවා තිබුණි.

| බැංකුවේ නම | 2013 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි ශේෂය | | මහා භාණ්ඩාගාරය ලබා දුන් ඇප සීමාවන් | | ඇප සීමාවන් ඉක්මවීම් | |
|---|---|---|---|---|---|---|
| | එ.ජ.ඩො මිලියන | රු. මිලියන | එ.ජ.ඩො මිලියන | රු. මිලියන | එ.ජ.ඩො මිලියන | රු. මිලියන |
| ලංකා බැංකුව | 1,811 | 239,617 | 900 | 119,106 | 911 | 120,511 |
| මහජන බැංකුව | 1,318 | 174,415 | 650 | 86,021 | 668 | 88,394 |

මේ සම්බන්ධව සංස්ථාවේ සභාපති මෙසේ දක්වා තිබුණි.

*"1971 අංක 38 දරන මුදල් පනතේ 17 වන වගන්තිය අනුව මූල්‍ය පාඩු ආවරණය කර ගැනීම සඳහා සහනාධාර නොලැබීම, ස්කන්ධ ප්‍රාග්ධන බාදනය හා සෘණ ශුද්ධ වත්කම් තත්ත්වයට ප්‍රධාන හේතු වේ. මෙම තත්ත්වය මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශයේ ලේකම් වෙත දැනුම් දී තිබේ. කෙසේ වෙතත් 2013 වර්ෂයේදී මහා භාණ්ඩාගාරයේ මැදිහත් වීම හේතු කොට ගෙන පොළී අනුපාත අඩු කිරීමක් සංස්ථාවට ලබා දී ඇත. තවද 2015 අය වැය ලේඛනයේදී රු. බිලියන 100 ක් ස්කන්ධ මූල්‍යකරණයක් ලෙස ලබා දීමට රජය එකඟ වී ඇත."*

**(ඇ) තෙල් ප්‍රවාහනය සඳහා නල මාර්ග ජාලය**

කොළඹ වරාය සිට කොලොන්නාව ඛණිජතෙල් ස්ථාපිතයට ආනයනික පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල් සහ දැව්තෙල් වැනි ඛණිජ තෙල් නිෂ්පාදිත ප්‍රවාහනය කිරීම සඳහා දශක කිහිපයකට පෙර ස්ථාපනය කරන ලද නල මාර්ග අළුත්වැඩියා කළයුතු තත්ත්වයේ පවතින අතර ඉන් නල මාර්ග කිහිපයක් අළුත්වැඩියා කිරීමට නොහැකි තත්ත්වයේ පැවතීම හේතුවෙන් දැනටමත් අත්හැර දමා තිබුණි. ඛනිජ තෙල් නිෂ්පාදනවල ජාතික අවශ්‍යතාවයෙන් විශාල ප්‍රමාණයක් මෙම දිරාපත් වූ නල මාර්ග තුලින් කොලොන්නාව ඉන්ධන ගබඩා පර්යන්තයට ගෙන යන බැවින් මෙම නල මාර්ග අළුත්වැඩියා කිරීම හා නවීකරණය කිරීම වහා කළ යුතු අවශ්‍යතාවයක් වී ඇත. එම අබලන් වූ නල මාර්ග තුලින් ආනයනික පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන ප්‍රවාහනය කිරීම නිසා උග්‍ර ඉන්ධන අර්බුදයක් සමග මුළු රටම අකර්මන්‍ය වීමේ අවදානම විගණනයේදී බැහැර කළ නොහැක.

මුතුරාජවෙල පර්යන්තයේ සිට කි.මී. 7.2ක් හා මුහුදු වෙරළේ සිට කි.මී. 6ක් පමණ දුරින් මුහුද මැද පිහිටුවා ඇති සිංගල් පොයින්ට් බෝයි මූරින් පහසුකම මාර්ගයෙන් මුතුරාජවෙල ස්ථාපිතයට නිෂ්පාදිත සැපයෙන අතර, මුහුදු රළ තත්ත්වය ඉතා දැඩිවන අවස්ථා වලදී හෝ අදාල පහසුකම පිළිබඳ නඩත්තු කටයුතු සිදුවන අවස්ථාවලදී වෙනත් විකල්ප සැපයුම් මාර්ගයක් නොවීය. අන්තර් පර්යන්ත නිෂ්පාදිත මාරු කිරීම සඳහා මුතුරාජවෙල පර්යන්තය හා කොලොන්නාව ස්ථාපිතය අතර සම්බන්ධකමක් නොවූ අතර, ඒ හේතුවෙන් එම පර්යන්ත දෙකෙහිම ප්‍රශස්ථ උපයෝජනයට බාධා වී තිබුණි.

“රට හරහා නල මාර්ග ව්‍යාපෘතිය” ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2012 සැප්තැම්බර් 13 දින ලබා දී තිබුණද, එම ව්‍යාපෘතිය මේ දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි.


**4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**--------------------------**

රටේ ඛනිජ තෙල් නිෂ්පාදිත අවශ්‍යතාවයෙන් දළ වශයෙන් 1/3ක් ආනයනය කෙරෙන බොර තෙල්වලින් දේශීයව පිරිපහදු ක්‍රියාවලිය සිදුකරන සපුගස්කන්දේ පිහිටි සංස්ථාවට අයත් පිරිපහදුවෙන් සපයා ගනු ලබේ. අඩු පිරිපහදු නිෂ්පාදනය, නවීකරණය කිරීම්වල සිදුවන ප්‍රමාදයන් සහ පිරිපහදුවේ පුළුල් කිරීම්වල පවතින අඩුපාඩු මත මෙහෙයුම් බිඳ වැටීම් සංසංථාවේ මූල්‍ය කාර්යසාධනය සඳහා ඍණාත්මකව බලපා තිබුණි.

2012 දී පිරිපහදු කළ බොර තෙල් ධාරිතාවය වන මෙට්‍රික් ටොන් 1,596,058 හා සසඳන විට 2013 වර්ෂයේදී එය මෙට්‍රික් ටොන් 1,643,218 දක්වා වැඩි වී තිබූ නමුත් ක්‍රියාවලි මට්ටම දිනකට නියම කර ඇති නිෂ්පාදන ධාරිතාව වන ටොන් 6,900 හෝ 2013 වර්ෂයේදී මෙට්‍රික් ටොන් 2,415,000 දක්වා ළඟා වී නොතිබුණි. 2013 වර්ෂය හා පෙර වර්ෂ දහයක බොර තෙල් ආදානය (intake) එම වර්ෂවල නිෂ්පාදන ධාරිතාවය හා සන්සන්දනාත්මකව ඊට අනුරූප වර්ෂයන් සමඟ පහත දැක්වේ.

| වර්ෂය | නිෂ්පාදනය සඳහා බොර තෙල් ආදාන ප්‍රමාණය (intake) | | වෙනස | |
|---|---|---|---|---|
| | පවතින ධාරිතාව (මෙට්‍රික් ටොන්) | සත්‍ය උපයෝජනය (මෙට්‍රික් ටොන්) | ප්‍රමාණය (මෙට්රික් ටොන්) | ප්‍රතිශතය |
| 2013 | 2,415,000 | 1,643,218 | 771,782 | 31.96 |
| 2012 | 2,242,500 | 1,596,058 | 646,442 | 28.83 |
| 2011 | 2,415,000 | 2,003,607 | 411,393 | 17.03 |
| 2010 | 2,242,500 | 1,752,716 | 489,784 | 21.84 |
| 2009 | 2,415,000 | 2,005,915 | 409,085 | 16.94 |
| 2008 | 2,242,500 | 1,870,237 | 372,263 | 16.60 |
| 2007 | 2,415,000 | 1,899,079 | 515,921 | 21.36 |
| 2006 | 2,415,000 | 2,140,132 | 274,868 | 11.38 |
| 2005 | 2,277,000 | 1,977,751 | 299,249 | 13.14 |
| 2004 | 2,415,000 | 2,216,646 | 198,354 | 08.21 |
| 2003 | 2,242,500 | 2,023,605 | 218,895 | 09.76 |




1969 වර්ෂයේදී ස්ථාපිත වර්ෂ 45 ක් පැරණි වූ මෙම පිරිපහදුවෙන් රටේ වැඩිවන ඛණිජතෙල් නිෂ්පාදිත අවශ්‍යතාවය සැපයීමට නොහැකි වී ඇති අතර, ඉතා අඩු පිරිවැයකට ඉන්ධන නිපදවීම සඳහා පහසුකම් ඇති සහ එමගින් පිරිපහදු මෙහෙයුම් කාර්යක්ෂමව උපරිම කිරීමට හැකිවන වෙනත් නවීන ලෝකයේ උසස් තාක්ෂණයන් සහිතව මෙහෙයුම් කෙරෙන පිරිපහදු සමඟ සැසඳීමේ දී මෙම පිරිපහදුව ඉතා අඩු කාර්යක්ෂමතාවයකින් මෙහෙයුම් සිදු කෙරේ. කෙසේ වුවද, පිරිවැය ඵලදායිතා ආකාරයෙන් ඛණිජතෙල් නිෂ්පාදිත වෙළඳපොළට සැපයීම තහවුරු කර ගැනීම සඳහා යෝජිත සපුගස්කන්ද තෙල් පිරිපහදුව පුළුල් කිරීම හා නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය (SOREM) ක්‍රියාත්මක කිරීමට ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාවට මෙතෙක් නොහැකි වී ඇත.

**4.4 මතභේදයට තුඩු දුන් කරුණු**

ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කර ඇති 2009 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා එම සමාගමට ගෙවා තිබූ රු. මිලියන 1,065.4ක් වූ අතිරික්ත පර්යන්ත ගාස්තු, එම සමාගම නැවත සංස්ථාවට ගෙවීමට තීරණයක් ගෙන නොතිබීම හේතුවෙන් සංස්ථාව ගිණුම්ගත කර නොතිබුණි.

**4.5 වත්කම් කළමණාකරණය**

පහත සඳහන් වත්කම් එම වත්කම් අත්කරගත් දින සිටම නිශ්කාර්යව පැවතුණි.

(අ) වනාතමුල්ලේ පිහිටි හල්ගහකුඹුර ඉඩම
එල්පී ගෑස් ව්‍යාපෘතිය සහ ක්‍රීඩා භූමියක් සඳහා මෙම ඉඩම රු.මිලියන 10.6කට අත්කර ගෙන තිබුණි.

(ආ) මාහේන ඉඩම
ලබා ගත හැකි වූ ලියවිලි අනුව, සංස්ථාව විසින් මෙම ඉඩම අත්පත් කර ගැනීම සඳහා රු. මිලියන 0.625ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද, මෙම ඉඩම සංස්ථාවේ පොත්වල ගිණුම් ගත කර නොතිබූ අතර 1986 වර්ෂයේ සිට එය පෙර අයිතිකරු විසින් භාවිතා කරමින් පැවතුණි.

(ඇ) ආයෝජන
2013 දෙසැම්බර් 31 දිනට කොටස් වෙළඳ පොළේ මිල සඳහන් කළ හා නොකළ සමාගම් හතරක කොටස්වල කළ ආයෝජනයන්හි ධාරණ අගය රු.මිලියන 38.636ක් විය. කෙසේ වෙතත් දිගු කාලයක සිට මේවායින් කිසිදු ලාභාංශයක් සංස්ථාවට ලැබී නොතිබුණි. තවද, රු. මිලියන 5 ක් ආයෝජන කර ඇති ජාත්‍යන්තර ඛනිජ තෙල් සමූපකාර සංගමයේ පැවැත්ම පිළිබඳව සංස්ථාව නොදනී.

**4.6 අනෙකුත් ආයතන සඳහා මුදා හරින ලද සම්පත්**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තිය ප්‍රකාරව රේඛීය අමාත්‍යාංශය වෙනුවෙන් හෝ වෙනත් රජයේ ආයතනයක් වෙනුවෙන් කිසිඳු අවස්ථාවක වියදම් දැරීමට හෝ එහි සම්පත් යෙදවීමට කිසිඳු රාජ්‍ය ව්‍යවසායකට අවසර ලබා දී නොමැත. කෙසේ වෙතත් සංස්ථාව පහත දැක්වෙන සම්පත් අනෙකුත් ආයතනවලට නිදහස් කර තිබූ අතර වටිනාකම රු.මිලියන 46 කට වඩා වැඩි ප්‍රමාණයක් වේතන හා නඩත්තු වියදම් ලෙස 2013 වර්ෂයේදී දරා තිබුණි. විස්තර පහත දැක්වේ.

| සම්පත් වර්ගය | සංඛ්‍යාව | දරන ලද පිරිවැය |
|---|---|---|
| | | රු. |
| මානව සම්පත් | 44 | 41,980,142 |
| වාහන | 07 | 4,461,920 |
| **එකතුව** | | **46,442,062** |

## 4.7 මානව සම්පත් කළමනාකරණය

සංස්ථාවේ 2013 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිවෙලින් 3,284ක් හා 2,581ක් විය. විස්තර පහත දැක්වේ.

| වර්ගය | අනුමත කාර්ය මණ්ඩලය | | තථ්‍ය කාර්ය මණ්ඩලය | | | | | | පුරප්පාඩු ගණන | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2013 | 2012 | 2013 | | | 2012 | | | 2013 | 2012 |
| | | | ස්ථිර | කොන්ත්‍රාත් පදනම | එකතුව | ස්ථිර | කොන්ත්‍රාත් පදනම | එකතුව | | |
| ජ්‍යෙෂ්ඨ | 446 | 372 | 293 | 03 | 296 | 300 | 01 | 301 | 153 | 72 |
| ද්විතීයික | 1,478 | 1,286 | 1,245 | 01 | 1,246 | 1,277 | 11 | 1,288 | 233 | 09 |
| ප්‍රාථමික | 1,360 | 1,347 | 1,033 | 06 | 1,039 | 1,060 | 10 | 1,070 | 327 | 287 |
| **එකතුව** | **3,284** | **3,005** | **2,571** | **10** | **2,581** | **2,637** | **22** | **2,659** | **713** | **368** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පුරප්පාඩු 713ක් අතුරින් සියයට 35ක් පමණ විධායක මට්ටමේ තනතුරු නියෝජනය වන අතර (වාණිජ කළමණාකරු සහ නියෝජ්‍ය සමානායාධිකාරී - අලෙවි ඇතුළුව) මෙවැනි විශාල පුරප්පාඩු සංඛ්‍යාවක් තිබියදීත් ප්‍රධාන මෙහෙයුම් ක්‍රියාවලීන්ට බලපෑමක් නොමැතිව ආයතනය පවත්වාගෙන යාම විගණනයට ප්‍රශ්නකාරී විය.

(ආ) සියළුම වර්ග වලින් තනතුරු 10ක් කොන්ත්‍රාත් පදනම මත පුරවා තිබූ අතර 2011 මැද භාගයේ සිට ප්‍රධාන අභ්‍යන්තර විගණක, නියෝජ්‍ය සාමානායාධිකාරී (මූල්‍ය) තනතුරේ වැඩ ආවරණය කර තිබුණි.

(ඇ) 2013 දෙසැම්බර් 31 දිනට පැවති තනතුරු පිරවීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

## 5. අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැය සහ තථ්‍ය ආදායම හා වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සංස්ථාවේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) වෙළඳ සහ වෙනත් ලැබිය යුතු මුදල්
(ආ) වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු මුදල්
(ඇ) ගිණුම්කරණය හා මූල්‍ය කළමණාකරණය
(ඈ) ප්‍රසම්පාදන
(ඉ) සම්පත් උපයෝජනය
(ඊ) මානව සම්පත් කළමනාකරණය
(උ) වත්කම් කළමනාකරණය